**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය - 2017**

**--------------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතයේ 9 ඡේදය ප්‍රකාරව තොග එහි පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට දැක්විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.17,499,471 ක් වූ තොගය තුල ඇතුලත් පිරිවැය රු.1,338,348 ක් වූ මෙවලම් හා ආම්පන්න සම්බන්ධයෙන් එවැනි ඇගයීමක් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 07 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.578,000,000 ක් වූ ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොලෙහි ආයෝජන හා බෙදාගැනුම් ආයෝජන රු.10,000,000 ක් වූ සත්දින ඒක්ෂන තැන්පතු, මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වනු වෙනුවට වෙනත් ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

ප්‍රමිතයේ 46 (අ) ඡේදය ප්‍රකාරව ණය හා ලැබිය යුතු දෑ සඵල පොළී අනුපාතයක් භාවිතා කර ක්‍රමක්ෂය කළ අගයට දැක්විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන රු.33,057,304 ක් වූ ණයගැති ශේෂ 362 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ආයතනයේ සේවකයින් 05 දෙනෙකු අනුයුක්ත කර වැටුප් වශයෙන් රු.663,675 ක් ගෙවා තිබුණු අතර එම මුදල 2018 ජුනි වන විටත් අමාත්‍යාංශයෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල ණයගැතියන්ගෙන් ලැබී අහරු වූ චෙක්පත් 10 ක එකතුව රු. 382,910 ක් නිරවුල් කර ගැනීමට 2018 අගෝස්තු දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 5,927,891 ක් වූ රඳවුම් මුදල් ශේෂය තුල ඇතුලත් රු.1,182,511 ක් වූ ශේෂයන් 14 ක් නිදහස් කල යුතු කාලය අවසන් වී අවුරුදු 04 ත් මාස 08 ත් අතර කාලයක් ගතවී තිබුණද, එම ශේෂ නිරවුල් කිරීමට 2018 අගෝස්තු වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxxii පරිච්ඡේදයේ 1.1 හා 1.3 වගන්ති | මාණ්ඩලික නිලධාරියෙකුට දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකමක් නොමැති අතර එවැනි නිලධාරියෙකු මැතිවරණයකට ඉදිරිපත්වීමට අදහස් කරන්නේ නම් රාජ්‍ය සේවයේ තමන් දරන තනතුරෙන් ඉල්ලා අස්විය යුතු වේ. එහෙත් සහකාර අධ්‍යක්ෂක තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකුට 2018 පෙබරවාරි 10 දින පැවැති පළාත් පාලන මැතිවරණයේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම සඳහා 2017 දෙසැම්බර් 21 සිට 2018 පෙබරවාරි 10 දක්වා වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) මුදල් රෙගුලාසි 802 (2) හා 1647 (ඉ) | වාහන සම්බන්ධයෙන් ඒ ඒ වාහනයේ වර්ගය හා මොස්තරය, ලියාපදිංචි කිරීමේ අංකය, මිලදී ගත් දිනය, පිරිවැය, භාරදුන් දිනය, පැවරු දිනය, විටින් විට කල අලුත්වැඩියාවන් ආදී විස්තර ඇතුලත් කර වාහන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 110 | ආයතනය විසින් හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 (ඇ) හා 1646 | ආයතනය සතු වාහන සම්බන්ධයෙන් 268(අ) වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව ගමන් පිළිබඳ මාසික සාරාංශයන් සම්පූර්ණකර නොතිබුණි. |
| (ඇ) 2015 මැයි 15 දිනැති අංක මු.අ. 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය 4(අ)(1)(iii) වගන්තිය | විදේශ ගමන් සඳහා සංයුක්ත දීමනා ගෙවීමේදී දෙවන ගණය අදාල වන නිලධාරීන් සඳහා පළමු ගණය අදාල කර ගනිමින් සංයුක්ත දීමනා ගෙවා තිබුණි. නියැදි විගණන පරීක්ෂාව අනුව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 14 කදී සහභාගීවූ නිලධාරීන් සඳහා සංයුක්ත දීමනා ලෙස රු. 919,933 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඈ) 2006 මැයි 30 දිනැති අංක 9/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සුළු සේවකයින්ගේ රාජකාරි වේලාව පැය 08 සිට 16.45 දක්වාද, අනෙකුත් සේවකයින්ගේ රාජකාරී වේලාව පැය 08.30 සිට පැය 16.15 දක්වාද විය යුතු වේ. එහෙත් ආයතනයේ සියලුම සේවකයින් සඳහා පැමිණීමේ වේලාව පැය 08.45 දක්වා ඉඩදී තිබුනද, ප්‍රමාද කාලය ආවරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2000 ජනවාරි 11 දිනැති අංක පිඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තු චක්‍රලේඛයට අනුව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පමණක් පදනම්ව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා, ඇඳුම් දීමනා, සති අන්ත දීමනා හා ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු. 25,024,326 ක්, රු.4,605,043 ක් රු. 3,530,025 ක්, හා රු. 1,988,465 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.125,931,329 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.163,483,894 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,552,565 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආයතනයේ ආයෝජන ආදායම් රු. 18,923,181 කින් වැඩිවූවද, මෙහෙයුම් ආදායම් රු. 22,224,157 කින් අඩුවීමත්, මෙහෙයුම් වියදම් රු.25,742,569 කින් වැඩිවීමත් මූල්‍ය ප්‍රතිඵලයහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු. 96,751,550 ක් වූ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.163,483.894 ක් වී තිබුණද 2017 වර්ෂයේදී රු.125,931,329ක් දක්වා අඩුවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවන ලද බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු. 385,973,930 ක් වූ දායකත්වය 2016 වර්ෂයේදී රු. 629,302,100 ක් දක්වා වර්ධනය වී තිබුණද, 2017 වර්ෂයේදී එය රු598,375,530 ක් දක්වා අඩුවී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලැසුම් කිරීම

------------------

භාණ්ඩ සහතිකකරණ ක්‍රමය යටතේ විගණනයක් සැලසුම් කිරීම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශය (TG-CP-04) ප්‍රකාරව ව්‍යාපෘති නිලධාරි විසින් නිෂ්පාදන ආයතනවල විගණන කටයුතු සිදු කිරීමේදී අදාල විගණන සැලැස්ම විගණනයට සතියකට පෙර බලපත්‍රලාභී නිෂ්පාදකවරයාට ඉදිරිපත්කර එය ස්ථිර කර ගැනීමත් දිනයක් වෙන්කරවා ගැනීමත් සිදුකල යුතුය. එසේ වුවද මෙසේ පූර්ව දැනුවත් භාවයක් සිදුකර විගණනයක් සිදුකිරීම තුලින් විගණනයේ සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමේ හැකියාව ගැටලු සහගත වේ.

#### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

-------------------------------------

ආර්ථිකයෙහි සියලුම අංශවල ප්‍රමිතිකරණය හා තත්ත්ව වැඩි දියුණුව මගින් ජන ජීවිතයෙහි ගුණාත්මක බව වර්ධනය කිරීමට නායකත්වය සපයන්නාවූ රටේ ප්‍රමුඛ ජාතික ආයතනය බවට පත් වීම ආයතනයේ දැක්ම වුවත්, ආයතනයේ කාර්යසාධනය ඇගයීමේදී ඒ සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

**(අ) වෙළෙඳපොල නියැදි පරීක්ෂා සිදු කිරීම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත ප්‍රකාරව පරිභෝජනය සඳහා ඇති නිෂ්පාදනවල තත්ත්වය සහතික කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යයක් වුවද ඒ සඳහා වෙළඳපොල නියැදි පරීක්ෂා කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රමිත සහතික ලබා දීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද GL-CR-06 දරන මාර්ගෝපදේශය ප්‍රකාරව නියැදි පරීක්ෂණ සැලැස්මකට අනුව වෙළඳපොල නියැදි පරීක්ෂා කල යුතු වේ. සමාලෝචිත වර්ෂය සඳහා රු.1,500,000 ක ප්‍රතිපාදන මගින් වෙළඳපොල නියැදි පරීක්ෂා 60 ක් සිදු කිරීමට සැලසුම්කර තිබුණද, ඒ සම්බන්ධයෙන් විස්තරාත්මක සැලැස්මක් සකස් කර නොතිබුණු අතර බලපත්‍රලාභීන් 850 ක් පමණ සිටියදී සැලසුම් කරන ලද නියැදි පරීක්ෂණ 60 න් 39 ක් පමණක් සිදුකර තිබුණි.

**(ආ) ටින් මාලුවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම**

---------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේදී විදේශීය නිෂ්පාදන සමාගමකින් අවස්ථා 144 කදී සිදු කරන ලද කිලෝ ග්‍රෑම් 8,321,190 ක් වූ ටින් මාළු ආනයනයෙන් අවස්ථා 49 කදි ආනයනය කරන ලද එ.ජ.ඩොලර් 7,878,766 ක් වටිනා ටින් මාළු කිලෝ ග්‍රෑම් 2,406,088 ක් සම්බන්ධයෙන් නියැදි පරීක්ෂණ සිදුකර තිබුණද, ඉන් අවස්ථා 42 කදි ආනයනය කරන ලද එ.ජ.ඩොලර් 7,287,075 ක් වටිනා ටින් මාළු කිලෝ ග්‍රෑම් 2,019,581 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 591:2014 හි 5.15 වගන්තියෙහි සඳහන් බැර ලෝහ පිළිබඳ පරීක්ෂාව සිදුකර නොතිබුණි.

(ii) විදේශීය නිෂ්පාදන සමාගමකින් ආනයනය කරන ලද එ.ජ.ඩොලර් 57,560 ක් වූ ටින් මාලු කිලෝ ග්‍රෑම් 34,244 ක පරීක්ෂණ වාර්තා සතුටුදායක බව සඳහන් කරමින් වෙළඳපළට නිකුත් කිරීම සඳහා 2017 ඔක්තෝබර් 09 දින අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත් වෙළඳපොලෙහි පවතින මෙම තොගය ප්‍රමිතියට අනුකූල නොවන බැවින් වෙළෙඳපොලෙන් ඉවත්කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් 2018 මැයි 16 දින සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කර තිබුණි.

**(ඈ) ආනයනික මාගරින්වල ප්‍රමිතිය පරීක්ෂාව**

(i) සමාලෝචිත වර්ෂයේදී විදේශීය නිෂ්පාදන සමාගමකින් අවස්ථා 28කදී ආනයනය කරන ලද එ.ජ.ඩොලර් 482,736 ක් වූ මාගරින් කිලෝග්‍රෑම් 607,800ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 1427: 2011 හි 5.6 වගන්තියෙහි සඳහන් බැර ලෝහ පරීක්ෂාව සිදු කර නොතිබුණි. ඉන් අවස්ථා 14කදී ආනයනය කරන ලද එ.ජ.ඩොලර් 245,426 ක් වටිනා මාගරින් කිලෝග්‍රෑම් 306,600 ක් සඳහා, 5.5 වගන්තියෙහි සඳහන් ක්ෂුද්‍රජීවී පරීක්ෂාව සිදු කර නොතිබුණි.

(ii) නියැදි පරීක්ෂාවෙන් ලද පරීක්ෂණ වාර්තාවල ප්‍රතිඵලයන් සලකා බලා වෙළඳපොල වෙත භාණ්ඩ මුදා හැරීමට අවසර ලබා දිය යුතු වුවත් අවස්ථා 6 කදී ආනයනය කරන ලද එ.ජ.ඩොලර් 98,073 ක් වටිනා මාගරින් කිලෝග්‍රෑම් 86,655 ක් පරීක්ෂණ වාර්තා ලැබීමට ප්‍රථමයෙන් වෙළඳපොලට මුදා හැරීමට අවසර ලබා දී තිබුණි.

**(ඇ) ආනයනික ළදරු සබන්වල ප්‍රමිතිය පරීක්ෂාව**

(i) 2016 වර්ෂයේ සිට 2018 මැයි දක්වා විදේශීය සමාගමකින් අවස්ථා 24 කදී ආනයනය කරන ලද ළදරු සබන් කිලෝ ග්‍රෑම් 190,727 ක් සඳහා නියැදි පරීක්ෂා සිදු කර තිබුනද, ඉන් අවස්ථා 23 කදීම පරීක්ෂා කර තිබුණේ අදාල ප්‍රමිතියෙහි සඳහන් පරාමිතීන් 6 අතුරින් පරාමිතීන් 4 ක් පමණි.

(ii) අවස්ථා 20 කදී කිලෝ ග්‍රෑම් 152,853 ක් වූ තොග සඳහා නියැදි පරීක්ෂා සිදුකරන තුරු ආනයනකරුගේ පෞද්ගලික ඇපවීමක් මත තොග ආනයනකරුගේ ගබඩා වෙත නිදහස් කිරීමට අනුමැතිය දී තිබූ බව නිරීක්ෂණය විය. රේගුවෙන් තොග මුද්‍රා තැබීමක් සිදු නොකරන බැවින් තොග වෙළඳපොලට නිකුත් නොවන බවට තහවුරු කර ගැනීම සඳහා පුද්ගලික ඇපවීමක් ලබා ගැනීමේ ප්‍රමාණවත් භාවය විගණනයේ දී ගැටලු සහගත විය.

**(ඉ) ප්‍රමිතියෙන් යුතු ආරක්ෂිත හිස්වැසුම් වෙළෙඳපොලට නිකුත් කරන බව තහවුරු කිරීම**

සමාලෝචිත වර්ෂයේ මාර්තු 20 දින විදේශීය නිෂ්පාදන සමාගමකින් වටිනාකම එ.ජ.ඩොලර් 20,885 ක් වූ හෙල්මට් 7,536 ක් ආනයනය කර තිබූ අතර මෙම තොගය ආනයනකරුගේ ගබඩාව වෙත මුදා හැරිය හැකි බවත්, නියැදි ලබාගත් පසු වෙළඳපොලට නිකුත් කල හැකි බවත් 2017 අප්‍රේල් 04 දින ශ්‍රී ලංකා රේගුවට දන්වා තිබුණි. පසුව ලද පරීක්ෂණ වාර්තා අනුව අදාල තොගය ප්‍රමිතයේ සඳහන් අවශ්‍යතාවයන් 2කට අනුකූල නොවන බැවින් ප්‍රති අපනයනය කල යුතු බව 2017 මැයි 19 දින ආනයනකරුට දන්වා තිබුණි. එහෙත් සම්පූර්ණ තොගයම විකුණා අවසන් බව 2017 ජුනි 02 දින ආනයනකරු විසින් දන්වා තිබුණි.

**(ඊ) ප්‍රමිත ලාංඡන බලපත්‍ර ලබා දීම හා අවලංගු කිරීම**

-------------------------------------------------------

(i) නිෂ්පාදන සමාගමක් විසින් එක්තරා වෙළඳනාමයක් යටතේ අයඩීන් මිශ්‍ර සාමාන්‍ය ලුණු නිෂ්පාදනයක් සඳහා ලබාගෙන තිබූ බලපත්‍රයේ වලංගු කාලය 2017 පෙබරවාරි 09 දින අවසන් වී තිබුණු අතර 2017 මාර්තු 14 දින ආයතනය විසින් බලපත්‍රය අලුත් කිරීම සඳහා සිදු කල විගණනයේ දී කර්මාන්තශාලා පරිශ්‍රය නිසි පරිදි නඩත්තු කර නොතිබීම හේතුවෙන් ප්‍රමිතියට අනුකූල නොවන බව නිරීක්ෂණය කර තිබුණි. එසේ වුවද, බලපත්‍රය මාස 6 කින් දීර්ඝ කර තිබුණු අතර 2017 මාර්තු 14 දින ලබාගත් නියැදිවලට අදාල පරීක්ෂණ වාර්තාව පෙර බලපත්‍රය කල් ඉකුත්වී මාස 6 කට වැඩි කාලයකට පසු 2017 අගෝස්තු 28 දින ලැබී තිබුණි. එම වාර්තාව අනුව පරාමිතීන් 3 ක් අසමත් වී තිබුණද, නැවත මාස 10 කට බලපත්‍රය දීර්ඝකර තිබුණු අතර නැවත පරීක්ෂාවක් සඳහා නියැදි ලබා ගැනීම බලපත්‍රය දෙවන වරට දීර්ඝ කර මාස 9 කට පසුව සිදු කර තිබුණි.

(ii) බලපත්‍ර අවලංගු කිරීම සඳහා වූ මාර්ගෝපදේශයෙහි (PR-CP-08) 5.2.2, 5.2.4 හා 5.2.5 වගන්ති ප්‍රකාරව බලපත්‍රයක් අවලංගු කිරීමේදී SLS ලකුණ භාවිතය නවතා තිබේද යන්න පරීක්ෂා කල යුතු අතර අවලංගු කිරීම පිළිබඳව මාධ්‍ය මඟින් ප්‍රසිද්ධ කල යුතු වේ. නියැදි විගණන පරීක්ෂාව අනුව 2016 හා 2017 වර්ෂවලදී බලපත්‍ර 14 ක් අවලංගු කර තිබූ නමුත් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

තවද, බලපත්‍රය අවලංගු කළ විට ආයතනය වෙත නිකුත් කරන ලද මුල් බලපත්‍රය නැවත ලබා ගැනීම, අදාල දිනය වන විට එක් එක් ආයතනය සතුව SLS ලාංඡනය සහිතව භාණ්ඩ කොපමණ ප්‍රමාණයක් වෙළඳපොලේ පවතීද යන්න පිළිබඳ ඇස්තමේන්තුවක් ලබා ගැනිම, දැනට SLS ලාංඡනය සහිත ලේබල් ආයතනය සතුව පවතී නම් එම ලේබල් වලින් SLS ලාංඡනය ඉවත් කිරීමට දැන්වීම හා වෙළඳ ප්‍රචාරණ මාධ්‍යවල SLS ලාංඡනය තවදුරටත් යොදානොගන්නා බවට තහවුරුකර ගැනීම වැනි පසුවිපරම් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(iii) SLS ලකුණ අවසරයකින් තොරව භාවිතා වීම වැලැක්වීම සඳහා බලපත්‍ර අවලංගු කල වහාම නිෂ්පාදකයින් දැනුවත් කළ යුතු වුවද, 2016 වර්ෂයේදී අවලංගු කරන ලද බලපත්‍ර 13ක් සම්බන්ධයෙන් නිෂ්පාදකයින් දැනුවත් කිරීම සඳහා අවලංගු කල දින සිට මාස 02 සිට මාස 16 දක්වා කාලයක් ගතවී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂා සිදු කිරීම

--------------------------

(i) සමාලෝචිත වර්ෂයේදී ආනයනය කරන ලද ආහාර හා ආහාර නොවන භාණ්ඩ තොගයන් 344කට අදාලව ප්‍රමිති පරීක්ෂා කිරීම සඳහා නියැදි ලබා ගෙන 2018 අගෝස්තු වන විට මාස 07 සිට මාස 19 දක්වා කාලයක් ගතවී තිබුණ ද, පරීක්ෂණ වාර්තා ලබා දී නොතිබුණි. එසේ වුවද එම 344 ක තොගයෙන් තොග 157 කට අදාලව සිදු කල විගණන පරීක්ෂාවේ දී, භාණ්ඩ තොග 97ක් වෙළඳපොල වෙත නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර භාණ්ඩ නොවිකුණන බවට පුද්ගලික ඇපකරයක් ලබා ගෙන භාණ්ඩ තොග 58 ක් ආනයනකරුවන්ගේ ගබඩාව වෙත මුදා හැරීමට අනුමැතිය ලබා දී තිබුණි.

(ii) 2014 ජනවාරි 08 දිනැති අංක 1844/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව ආනයනකරුවකු විසින් භාණ්ඩ විකිණීම, භාවිතය හෝ බෙදාහැරීම සිදු නොකල යුතු වේ. ඒ සම්බන්ධයෙන් ආයතනයට සහ ශ්‍රී ලංකා රේගුවට සාමූහික වගකීමක් පවතින අතර ඒ අනුව භාණ්ඩ මුද්‍රා තැබීමට නිර්දේශයක් ලබාදීම හෝ තුන්වන පාර්ශවයකින් ඇපවීමක් ලබා ගැනීම ආදී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(ආ) ගිනිකූරු නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිත ලාංඡන බලපත්‍රය ලබා ගැනීම 2012 වර්ෂයේ සිට අනිවාර්ය කර තිබු අතර ඒ සම්බන්ධයෙන් නිෂ්පාදකයින් 22 ක් ලියාපදිංචි වී තිබුණි. එසේ වුවද, බලපත්‍රය ලබා දීමේදි ප්‍රමිතයෙහි 4.3 ප්‍රකාරව සිදු කළ යුතු ආරක්ෂාව පිළිබඳ පරික්ෂාව සිදු කර නොතිබුණි. එයට පිළිතුරු වශයෙන් එම පරීක්ෂාවන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල රසායනාගාර පහසුකම් නොමැති බව කළමනාකරණය දන්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සේවා ගණ 08ක සේවකයින් සේවයෙහි ස්ථිර කිරීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු වුවත්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි.

නියැදි විගණන පරීක්ෂාව අනුව 2013 හා 2014 වර්ෂවලදී බඳවාගෙන තිබූ සේවකයින් 38 දෙනෙකු 2016 හා 2017 වර්ෂවලදී සේවයෙහි ස්ථිරකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් සේවා කාලය වර්ෂ 03 සම්පූර්ණකර තිබුණද කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණකර නොතිබුණි.

(ඈ) අභිප්‍රේරණ දීමනා ගෙවීම

-----------------------------

මාසික සමුච්චිත තත්‍ය ආදායම හා මාසික සමුච්චිත ඉලක්කගත ආදායම අතර පවතින විචලතාවය හා පැමිණීම පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදී රු. 25,024,326 ක් අභිප්‍රේරණ දීමනා ලෙස ආයතනයේ කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) එක් එක් අංශවල ඉලක්කගත ආදායම ගණනය කල ක්‍රමවේදය හා එම ඉලක්ක කරා ලගාවීම සඳහා ස්ථාපිත උපායමාර්ග විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ii) එක් එක් අංශවලට ඉලක්ක ලබා දීමේ දී එම අංශවල පසුගිය වසරේ ලැබූ සාර්ථකත්වය සලකා බලන බව සඳහන් කළත්, පසුගිය වර්ෂයේ ලගාකරගත් ප්‍රගතියට සාපේක්ෂව ආයතනයේ අංශ 09 න් අංශ 08කට අඩු ඉලක්කයන් ලබා දී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ ආයතනයේ තත්‍ය ආදායම රු. 747,488,328 ක් වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ලබා දී තිබූ ඉලක්කගත ආදායම රු.624,890,000 ක් විය.

(iii) මෙම අභිප්‍රේරණ දීමනා ගෙවීම නිසා ආයතනයේ ආදායම ඉහළ නැංවී ඇති බව 2017 දෙසැම්බර් 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල සඳහන් වී තිබුණද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ළඟා කර ගත් ආදායම රු. 7,840,817 කින් අඩු වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදි පිරිවැය රු. 32,376,278 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස හඳුනාගත් ස්ථාවර වත්කම් අපහරණය කිරීමට 2017 මාර්තු 27 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. මෙම වත්කම් ශ්‍රී ලංකා යුධ හමුදාවට භාරදුන් බවට සඳහන් කළද, විධිමත් පරිදි භාරගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඉන්ධන බිල්පොත් සම්බන්ධයෙන් 2017 නොවැම්බර් 30 දින සිදු කරන ලද පරීක්ෂාවේදී දිනය හා වාහන අංකය පමණක් සටහන් කර වටිනාකම හා ප්‍රමාණය ඇතුලත් කරනු ලබන තීරු හිස්ව තබන ලද බිල්පත් 36 ක බලයලත් නිලධාරියෙකු විසින් අත්සන් යොදා තිබුණු බව නිරීක්ෂණය විය. වාහන පාලනය සම්බන්ධයෙන් ආයතනයෙහි ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක නොවන බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ඇ) රසායන ද්‍රව්‍ය කලින් කලට පරික්ෂාකර බලා කල් ඉකුත් වන විට අපහරණය කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ආයතනය විසින් අනුගමනය කර නොතිබුණු අතර රසායන ද්‍රව්‍ය ගබඩාවේ පැවති 1996 වර්ෂයේ සිට 2015 දක්වා කාලය තුල කල් ඉකුත්වූ රසායන ද්‍රව්‍ය අයිතම 25 ක් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටද කටයුතු කර නොතිබුණි. තවද, වසර 10කට අධික කාලයක සිට නිකුත් නොකරන ලද පිරිවැය රු.670,626 ක් වූ රසායනාගාර වීදුරු උපකරණ අයිතම 103 ක් හා පිරිවැය රු. 1,839,338 ක් වූ රසායන ද්‍රව්‍ය අයිතම 454 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) DMS/1610/VOL-1m හා 2016 දෙසැම්බර් 22 දිනැති කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරෙහි පුරප්පාඩු 15 ක් පිරවීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද 2017 නොවැම්බර් 01 දින අදාල තනතුර සඳහා 19 දෙනෙකු බඳවාගෙන තිබුණි. අතිරේක බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අදාල බඳවාගැනීමේ පටිපාටියේ 5.4.1 වගන්තිය ප්‍රකාරව ලිඛිත පරීක්ෂණයක් පවත්වා තෝරා ගැනීම සිදු කල යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී කළමණාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුර සඳහා නිලධාරින් 06 ක් ද, කණිෂ්ඨ කළමණාකාර (තාක්ෂණික) තනතුර සඳහා නිලධාරින් 10ක් ද බඳවාගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, පුහුණු සේවකයන් හෝ භෞතික පහසුකම්වල අවශ්‍යතාවයන් හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 6.1 ප්‍රසම්පාදනයන්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) ප්‍රකාරව, ආයතනය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පියවරයන් සඳහා කාලයන් තීරණය කෙරෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ඉටු කිරීමට සැලසුම් කල රු. මිලියන 424.23 ක් වූ ප්‍රසම්පාදනයන් 49 කින් රු. මිලියන 206 ක් වූ ප්‍රසම්පාදනයන් 04 ක්, අදාල අංශවලින් මිලදී ගැනීමේ ඉල්ලුම්පත් නොලැබීම, පිරිවිතර සකස් නොකිරීම, ආදි කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබූ අතර රු.මිලියන 29 ක් වූ ප්‍රසම්පාදනයන් 11 ක් ලංසු ආරාධනා කිරීමේ අදියර හා ලංසු ඇගයීම් අදියරයන්හි පැවතුණි. ප්‍රසම්පාදන සැලැස්මෙහි අයිතම විශාල ප්‍රමාණයක් පවතින බැවින් එය කාලානුරූපීව සමාලෝචනය කර සංශෝධනය කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (ආ) අනුව ලංසු වැසීමත් සමගම හැකිතාක් ඉක්මනින් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කල යුතු වුවත්, රු.11,735,546 ක් වූ උපකරණ 07ක ප්‍රසම්පාදනයන්ට අදාලව ලංසු ආරාධනා ලිපිවල ලංසු විවෘත කරන වේලාව සහ එම අවස්ථාවට පැමිණෙන ලෙස ආරාධනාවක් ඇතුලත් කර නොතිබුණු අතර ලංසු විවෘත කිරීම සඳහා ලංසු වැසීම සිදු කළ දින සිට දින 06 සිට දින 35 දක්වා කාලයක් ගතකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව රු.500,000 ට වැඩි භාණ්ඩ මිලදී ගැනීම්වලදී සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹිය යුතු වුවත්, රු.23,272,050 ක් වූ උපකරණ 08 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයන් සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඉ) ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වාදීමට අදාලව උපදේශන සේවා ලබා ගැනීම සඳහා 2017 වර්ෂයේදී උපදේශන සේවා ආයතනයක් සමඟ රු.5,000,000 ක වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණි. ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන මාර්ගෝපදේශ 2.6.3 ප්‍රකාරව, උපදේශන ප්‍රසම්පාදන කමිටුව ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිළධාරි විසින් පත්කල යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනයට අදාල උපදේශන ප්‍රසම්පාදන කමිටුව ආයතනය විසින් පත්කර තිබුණි. තවද, මාර්ගෝපදේශ 2.3.1(c) හා 2.3.1(d) ප්‍රකාරව අභිලාෂ ප්‍රකාශ ගෙන්වා ගැනීමේ දැන්වීම, සහ යෝජනා සඳහා ඉල්ලුම් කිරීමේ ලේඛන (Request for Proposal) සකස්කර උපදේශන සේවා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර මාර්ගෝපදේශ 6.2.1, 7.1.1 (b), 8.8.2 ප්‍රකාරව තරඟකාරී ආයතනවලින් යෝජනා ලබාගෙන ඇගයීම් සිදුකර සුදුසු ආයතනය තෝරාගත යුතු වුවත් එසේ සිදු නොකර එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා එම ආයතනය තෝරාගෙන තිබුණි.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

---

අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අගයන් අතර සියයට 15 සිට සියයට 407 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | තොග ලෙජරය විධිමත්ව පවත්වා නොගැනීම. |
| (ආ) තොග පාලනය | (i) පවත්වාගෙන යනු ලබන පරිගණක පද්ධතියෙන් තොග සම්බන්ධ ඇතැම් තොරතුරු ලබාගත නොහැකිවීම.<br>(ii) භාණ්ඩ ලේඛන පොත් යාවත්කාලීනව පවත්වා නොගැනීම<br>(iii) තොග පාලන ක්‍රමවේද අනුගමනය නොකිරීම. |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීම සම්බන්ධ පසුවිපරම් සිදු නොකිරීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය. | (i) ස්ථාවර වත්කම් ලේඛණය තුල ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කර නොතිබීම.<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනයෙහි වත්කම් අයිතමවල සිදුකරන වෙනස් කිරීම් සඳහා බලය ලත් නිලධාරියෙකු විසින් අත්සන් යොදා නොතිබීම. |
| (ඉ) වාහන පාලනය. | (i) ලොග් සටහන් පොත් විධිමත්ව නඩත්තු නොකිරීම.<br>(ii) ඉන්ධන පරිභෝජනය පරීක්ෂා නොකිරීම.<br>(iii) ධාවන සටහන් විධිමත් පරිදි නඩත්තු නොකිරීම.<br>(iv) ඉන්ධන බිල් පිළිපත් හා ඉන්වොයිස්පත් අතර වෙනස්කම් පැවතීම. |
| (ඊ) සේවක කළමනාකරණය | පෞද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වා නොගැනීම. |
| (උ) ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම. |
| (ඌ) රසායනාගාර පාලනය | පරීක්ෂණ අනවශ්‍ය ලෙස ප්‍රමාද වීම හා තොරතුරු කළමනාකරණ පද්ධති භාවිතා කර නොතිබීම. |
| (එ) තොරතුරු තාක්ෂණ පද්ධතිය | (i) තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කර නොතිබීම.<br>(ii) තොරතුරු තාක්ෂණ පද්ධතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආරක්ෂණ වැඩ පිළිවෙලක් යොදා නොතිබීම.<br>(iii) ඇතැම් තොරතුරු ලබාගැනීමේ අපහසුතා පැවතීම.<br>(iv) එක් එක් පද්ධති අතර අන්තර් සම්බන්ධතාවය නොතිබීම.<br>(v) පද්ධතියේ ඇතැම් අංශ යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| (ඒ) ලිපිගොනු පාලනය | (i) ලිපිගොනු අංකනය නොකිරීම<br>(ii) බාහිර පාර්ශවයන්ට යවන ලිපි, යොමු අංකයකින් තොරව නිකුත්කළ අවස්ථා පැවතීම |